# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2257/19 - 2021 දෙසැම්බර් මස 06 වැනි සඳුදා - 2021.12.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2013

### (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත

(460 වන අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් පනවනු ලැබ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2021 නොවැම්බර් මස 11 වැනි දින අනුමත කරන ලද නියෝග.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

කලින් කල සංශෝධිත පරිදි 2014 මැයි මස 30 වැනි දින අංක 1864/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2013 ඉඩම් අත්පත් කර ගැනීමේ (වන්දි ගෙවීමේ) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 2 වන නියෝගයේ (2) වන ඡේදයේ (ය) උපඡේදයේ "අධිවේගී මාර්ග ව්‍යාපෘති දිගුව." යන වචන වෙනුවට "අධිවේගී මාර්ග ව්‍යාපෘති දිගුව ;" යන වචන ආදේශ කිරීමෙන් ;


1A - G 35510 — 50 (2021/12)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එහි 2 වන නියෝගයේ (2) වන ඡේදයේ (ය) උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන උපඡේද ඇතුළත් කිරීමෙන් :-

"(අආ) උතුරු මැද මහ ඇළ ව්‍යාපෘතිය :

(i) උතුරු මැද මහ ඇළ ව්‍යාපෘතිය (UEC-ICB-2A) - කෝඳුරුවාව සිට නාමල්පුර දක්වා උමං මාර්ගය හරහා ඇළ මාර්ගය ඉදි කිරීම - සම්පූර්ණ දිග කි.මී. 28.09 ;

(ii) උතුරු මැද මහ ඇළ ව්‍යාපෘතිය (UEC-ICB-3) - කෝන්ගැටිය ජලාශයේ සිට කෝඳුරුවාව දක්වා කොටස - සම්පූර්ණ දිග කි.මී. 21.2 ;

(iii) උතුරු මැද මහ ඇළ ව්‍යාපෘතිය (UEC-ICB-4) - නාමල්පුර සිට යකල්ල දක්වා කොටස - සම්පූර්ණ දිග කි.මී. 9.9 ;

(iv) උතුරු මැද මහ ඇළ ව්‍යාපෘතිය (UEC-ICB-5) - යකල්ල සිට එරු වැව සහ මහ කනදරා ඔය දක්වා කොටස - සම්පූර්ණ දිග කි.මී. 29.9 ;

(අආ) පහළ මල්වතුඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ;

(අඇ) මුන්දෙනි ආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය ;

(අඈ) කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය ;

(අඉ) තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය ;

(අඊ) කිරිඳිඔය වාරිමාර්ග සහ පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ;

(අඋ) පෙතියාගොඩ යෝජිත පොම්පාගාරය ඉදිකිරීම ;

(අඌ) ඇල්ලෙවැව ජලාශය ඉදිකිරීම ;

(අඑ) වැමැඩිල්ල ජලාශ ව්‍යාපෘතිය ;

(අඒ) වැව්පිටිය වැව ඉදිකිරීම ;

(අඔ) දඹවින්න ව්‍යාපෘතියේ පූනා වැවේ ධාරිතාව ඉහළ නැංවීම ;

(අඕ) හකිරිල්ල වැව ඉදිකිරීම ;

(අක) කිරම ඔය බස්නාවේ මෝය කට පුළුල් කිරීම ;

(අග) හල්පාතොට යාන්ත්‍රික ඉංජිනේරු වැඩපළ සහ එහි කාර්යාලය සහිත ඉඩම් අත්කර ගැනීම ;

(අච) උඩුගොඩ බණ්ඩාර ඇළ ව්‍යාපෘතියේ මහර බණ්ඩාර වැවේ ප්‍රධාන ඇළ මාර්ගය ;

(අජ) මහඔය ජලාශය ;

(අට) සියඹලන්ගමුව ඔය සිට මහ ගල්ගමුව වැව දක්වා වූ පෝෂිත ඇල මාර්ග ව්‍යාපෘතිය ඉදිකිරීම ; සහ

(අඩ) ගිං නිල්වලා ව්‍යාපෘතිය.".

EOG 12 - 0055

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.